# කර්මාන්ත නැංවීම සඳහා ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර අවබෝධතා ගිවිසුමක්

**ජී.ආර්. ජයතිලක**
**අධ්‍යක්ෂ**
**ක්‍රම සම්පාදන අංශය**

සුළු පරිමාණ කර්මාන්ත සංවර්ධනය පිළිබඳ ඉන්දියාවට දිගු ඉතිහාසයක් ඇති අතර, එය බොහෝ සංවර්ධනය වන රටවලට ආදර්ශයට ගත හැකි එකකි. මේ සඳහා අවබෝධතා ගිවිසුම 2004 ජනවාරි මස 22 දින ඉන්දියානු රජය වෙනුවෙන් කුඩා පරිමාණ කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් ශ්‍රී. බී. එස්. මින්හාස් ද, ශ්‍රී ලංකා රජය වෙනුවෙන් ආචාර්ය උපනන්ද විදානපතිරණ මහතාද අත්සන් තබා ඇත.

මෙම අවබෝධතා ගිවිසුමේ පළමු ඒකාබද්ධ සමුළුව 2005 ජූලි 7 - 8 දින වලදී ඉන්දියාවේ නව දිල්ලි නගරයේදී පවත්වා ඇත. ලංකාව නියෝජනය කරමින් කර්මාන්ත හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ ලේකම් ආචාර්ය යූ.විදානපතිරණ මහතා, කුඩා හා ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශයේ අතිරේක ලේකම් කේ.ආර්.සමරසිංහ මහතා උසස් තාක්ෂණ හා ජාතික ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්, එන්.එම්..ලාල් කුමාර මහතා හා කර්මාන්ත හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ ආර්ථික උපදේශක යූනිකා ඉන්ද්‍රරත්න මහත්ම මහත්මීන් සහභාගී වී ඇත. ඉන්දියානු නියෝජිත පිරිසේ සභාපති වශයෙන් කුඩා පරිමාණ කර්මාන්ත හා කෘෂි හා ග්‍රාමීය කර්මාන්ත අමාත්‍ය ලේකම්, අනුපම් දාස් ගුප්ත කටයුතු කළ මෙම සමුළුවේ ලංකා නියෝජිත පිරිසේ සභාපති වශයෙන් කටයුතුකර ඇත්තේ කර්මාන්ත හා ආයෝජන අමාත්‍යාංශයේ ලේකම් ආචාර්ය විදානපතිරණ මහතාය.

මෙම අවබෝධතා ගිවිසුම යටතේ පහත සඳහන් කරුණු ක්‍රියාත්මක කිරීමට යෝජනාකර ඇත.

### ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය හා ඉන්දියාවේ සී/ස. ජාතික කුඩා පරිමාණ කර්මාන්ත සංස්ථාව (National Small Industries Corporation - NSIC) සමඟ සහයෝගීතා වැඩසහනක් ආරම්භ කිරීම

මෙහිදී ලාංකික නියෝජිත පිරිස දක්වා ඇත්තේ ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ කාර්යයන්වලින් තාක්ෂණික දැනුම හා ඊට අදාළ පුහුණු කටයුතු කුඩා කර්මාන්තකරුවන් වෙනුවෙන් සැපයෙන හෙයින්, ඉන්දියානු රජයෙන් බලාපොරොත්තු වන්නේ තාක්ෂණික පර්යේෂණ හා පුහුණුවීම්වලට අදාල සහායන් බවත්ය. එහෙයින් විශේෂයෙන් මානව සම්පත් සංවර්ධනයට අදාළ ඉන්දියාවේ තාක්ෂණික සහාය ලබා ගැනීමට අවශ්‍ය බව යෝජනා වී ඇති අතර, මේ සඳහා කාර්මික සංවර්ධන මණ්ඩලය පිළිබඳව මූලික අවශ්‍යතා අධ්‍යයනයක් කිරීමට යෝජනාකර ඇත. මේ සඳහා ඉන්දියානු නියෝජිත පිරිස එකඟ වී ඇති අතර, ඒවායින් විශේෂිත අවශ්‍යතාවයන් මොනවාදැයි හඳුනාගන්නා ලෙස යෝජනා වී ඇත.

### ශ්‍රී ලංකාවේ තරුණයන් සඳහා ඉන්දියානු ආයතනවල පුහුණු/අධ්‍යාපන/දැනුවත්වීම් සංචාර සංවිධානය කිරීම

කර්මාන්ත ක්ෂේත්‍රයේ ව්‍යාපාර ආරම්භ කිරීමට අපේක්ෂිත ලාංකික තරුණයන් සඳහා පුහුණුවීම්, අධ්‍යාපන සංචාර හා දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීමට ශ්‍රී ලාංකික නියෝජිත පිරිස යෝජනාකර ඇති අතර, ඒ සඳහා ඉන්දියානු නියෝජිත කණ්ඩායම එකඟ වී ඇත. මේ සඳහා ඉන්දියාවේ ව්‍යවසායකත්ව හා කුඩා පරිමාණ ජාතික ආයතනය (The National Institute for Entereprencurship and Small Business Development ) වැනි ආයතන මගින් ශ්‍රී ලාංකික තරුණයන්ට පුහුණුව ලබාදිය හැකි බවත්, කෙසේ වෙතත් මෙම පුහුණුවීම්වලට පෙර පුහුණු අවශ්‍යතා පිළිබඳ අධ්‍යයනයක් කිරීම අවශ්‍ය බවත් ඉන්දියානු නියෝජිතයන් දන්වා ඇත.

### අලෙවි ප්‍රවර්ධන කටයුතු

ලාංකික නියෝජිත පිරිස අවබෝධතා ගිවිසුමට අනුව කර්මාන්ත සංවර්ධනය සඳහා අලෙවි ප්‍රවර්ධන කටයුතු එහි ඒකාබද්ධ අංගයක්වන හෙයින්, මේ සඳහා ආයතනික සහාය ලබා ගැනීමට විමසුම්කර ඇත. මෙහිදී ඉන්දියානු බලධාරීන් එම අදහසට එකඟවී ඇති අතර, ඉන්දියානු ටෙක්මාර්ට් ප්‍රදර්ශනයේ මේ සඳහා ඉඩකඩ ලබාදීමට එකඟවී ඇත. මෙම ප්‍රදර්ශනය සෑම වසරකම නොවැම්බර් මාසයේදී පැවැත්වෙන අතර, ඉන්දියාවේ කුඩා පරිමාණ කර්මාන්ත භාණ්ඩ විශාල වශයෙන් ප්‍රදර්ශනය කෙරෙන අතර, මෙහිදී ඉන්දියාවේ මෙන්ම විදේශීය සුළු පරිමාණ කර්මාන්තකරුවන් එකිනෙකා හමුවීමේ අවස්ථාව ලැබෙන අතර ඔවුනොවුන් අතර සබඳතා ඇතිවීමට අවස්ථාව ලැබේ. මෙහිදී ඉන්දියානු රජය ශ්‍රී ලාංකික කර්මාන්තකරුවන්ට මෙන්ම ප්‍රදර්ශනයක් කිරීමට අවස්ථාව ලබාදීමට එකඟ වී ඇත. මේ සඳහා තෝරාගත් වෙළඳ මණ්ඩලයක් නම් කිරීමට සාකච්ඡා වී ඇති අතර මේ සඳහා නිරතුරු සංචාරයන්කිරීම වෙළඳ මණ්ඩලය වෙත පැවරීම සුදුසු බවද යෝජනා වී ඇත. කර්මාන්ත හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ ලේකම් විසින් මෙම කාර්යය කුඩා පරිමාණ වෙළඳ සංගම් හා සාකච්ඡාකර තීරණයක් ගැනීමට එකඟ වී ඇත.

## උපදේශක සේවාවන්

ලාංකික දූත කණ්ඩායම් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන්ද උපදේශක සේවාවන් ලබා ගැනීමට සහාය ඉල්ලා ඇත.

අ. පර්යේෂණ, භාණ්ඩ සංවර්ධනය, තාක්ෂණික වැඩි දියුණුව හා පේටන්ට් වාණිජකරණය සඳහා තාක්ෂණික සංවර්ධන අරමුදලක් පිහිටුවීම.

ආ. කාර්මික නගර පිහිටුවීම

අළුතින් පිහිටුවීමට යෝජිත සුළු හා මධ්‍යම පරිමාණ අධිකාරිය යටතේ මෙවැනි තාක්ෂණික සංවර්ධන අරමුදලක් පිහිටුවීමට යෝජනා වී ඇත. කෙසේවෙතත් ඉන්දියානු නියෝජිතයන් යෝජනාකර ඇත්තේ එවැනි අරමුදලක අවශ්‍යතාවය ඇති වන්නේ සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර අධිකාරියක් පිහිටුවීමෙන් පසුව බවයි.

## උපකරණ ගබඩා පහසුකම් (Tool Room Facilities)

යන්ත්‍ර හා උපකරණ මිලදී ගැනීමට උපකරණ ගබඩා (Tool Room) මෙරටෙහි ඇති කිරීමටද ඉන්දියානු තාක්ෂණික සහාය බලාපොරොත්තු වි ඇත. මේ සඳහා ඉන්දියානු නියෝජිතයන් ප්‍රකාශකර ඇත්තේ වෙළඳ සංගම් මගින් එවැනි උපකරණ ගබඩා පිහිටුවන තෙක් කර්මාන්තකරුවන්ට එවැනි උපකරණ මිලදි ගැනීමට ඉන්දියානු ණය ක්‍රමය යටතේ පහසුකම් සැපයීම සුදුසු බවය.

මෙම යෝජනාවට ලාංකික නියෝජිත කණ්ඩායමේ යහපත් ප්‍රතිචාරයක් දැක්වූ ඉන්දියානු නියෝජිතයන් පවසා ඇත්තේ ඉන්දියාවේ දැනට මෙම ක්‍රමය ඒ ඒ අංශ සඳහා වෙන වෙනම ක්‍රියාත්මකවන අතර, ඒවා ස්වාධීන ආයතන වශයෙන් කටයුතු කරන බවය. මෙහි ස්වභාවය රඳා පවතින්නේ ඒ ඒ කර්මාන්ත කේෂ්ත්‍රවල අවස්ථාවන් පරිදි බවය. එමෙන්ම එවැනි උපකරණ මධ්‍යස්ථාන සාර්ථකව ක්‍රියාත්මක කිරීමට නම්, ප්‍රමාණවත් තරම් කර්මාන්තකරුවන් සංඛ්‍යාවක් සිටිය යුතු බව පෙන්වා දි ඇත. මේ සඳහා සවිස්තරාත්මක අධ්‍යයනයක් කිරීම අවශ්‍ය බව ඉන්දියානු නියෝජිතයන් දන්වා ඇති අතර, අවශ්‍ය ක්ෂේත්‍ර හඳුනා ගැනීම අපගේ වගකීමක් බව සඳහන්කර ඇත. මේ සඳහා දැනුවත්වීමටත් ඉන්දියාවේ ක්‍රියාත්මකවන එවැනි උපකරණ මධ්‍යස්ථාන දැකබලා ගැනීමටත් ලාංකික නියෝත පිරිස්වලට ආරාධනාකර ඇති අතර, මෙය ක්‍රියාත්මක කිරීමට කර්මාන්ත හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ ලේකම්තුමා එකඟ වී ඇත.

## කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර අධිකාරියක් පිහිටුවීම

දිවයිනෙහි කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර අධිකාරියක් පිහිටුවීමට තාක්ෂණික සහාය ද ලංකාවෙන් ඉල්ලා ඇති අතර, මෙහිදී වැඩිදුරටත් සඳහන්කර ඇත්තේ එවැනි ආයතනයක සුළු හා මධ්‍යම පරිමාණ අංශයට සේවාවන් ලබාදීමට පිහිටුවීම අවශ්‍ය බවයි. දැනටමත් මේ සඳහා දළ කෙටුම්පතක් සකස්කර ඇති බවත් මෙහි නීතිමය ව්‍යුහය සැකසීමට ඉන්දියානු උපදේශක මහතෙකුගේ සේවය අවශ්‍ය බැව් ඉල්ලා ඇත. මේ සඳහා ඉන්දියානු නියෝජිතයන් එකඟත්වය පළකර ඇති අතර, ඉන්දියාවේ සි/ස. ජාතික කුඩා කර්මාන්ත සංස්ථාව මෙවැනි කාර්යයන් පිළිබඳව මනා පළපුරුද්දක් තිබෙන බවද සඳහන් කර ඇත. මෙහිදී ඉන්දියානු නියෝජිතයින් සවිස්තරාත්මක තොරතුරු විමසා ඇති අතර විශේෂයෙන් කාලවකවානු, සේවා කොන්දේසි විශේෂිත ක්ෂේත්‍ර පිළිබඳ තොරතුරු අවශ්‍ය බව සඳහන්කර ඇත. එසේම දැනටමත් මේ සඳහා සකස් කර ඇති දළ කෙටුම්පත ලබාදෙන ලෙසද යෝජනා කර ඇත. මෙම තොරතුරු ලබාදීමට උසස් තාක්ෂණ හා ව්‍යවසාය ප්‍රවර්ධන අමාත්‍යාංශයේ ලේකම්තුමා එකඟවී ඇති බව සඳහන් වේ.

***කෙසේ වෙතත් මෙහිදී සඳහන් කළ යුත්තේ දැනටමත් සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්තකරුවන්ට සේවා සැපයීමට ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය පිහිටුවා ඇති බැවින්. තවදුරටත් නව ආයතන පිහිටුවීම අවශ්‍යද යන්නය. මෙම අධිකාරිය මගින් අප මණ්ඩලය මගින් සපයනු ලබන සේවාවන්ම සැපයීමට කටයුතු කිරීමක් නොවන්නේ නම් සුදුසුවේ.***

ඉන්දියාවේ ආර්ථික, සංස්කෘත අංශයන් බොහෝ සෙයින් අපගේ ඒවා හා සමාන හෙයින් සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්ත කෝෂ්ත්‍රයට අදාළව ඇති කරගෙන ඇති මෙම අවබෝධතා ගිවිසුම යෝජිත අයුරින් ක්‍රියාත්මක වන්නේ නම් මෙරට කර්මාන්තකරුවන්ට එය මහත් පිටුවහලක් බව නොකිවමනාය.

## කා.ස.ම. සම්භාණ්ඩ සංවර්ධන මධ්‍යස්ථානයේ ප්‍රථම ශාඛාව වාරියපොල

සම්භාණ්ඩ සංවර්ධන මධ්‍යස්ථානයේ ප්‍රථම ශාඛාව 2005 දෙසැම්බර් මස 29 දින කුරුණෑගල වාරියපොල ආරම්භ කිරීමට සියළු වැඩකටයුතු සංවිධානය කර ඇත. මෙම මධ්‍යස්ථානයට අවශ්‍ය සියළුම යන්ත්‍රෝපකරණ දැනට මිලදී ගනිමින් පවතී.

වත්මන් රජයේ කඩිනම් **"රැකියා බිහිදොර"** වැඩසටහන යටතේ මෙම මධ්‍යස්ථානය මගින් රැකියා අවස්ථා 100 ක් ලබාදීමට අපේක්ෂා කෙරේ.